# හා පැංචාගෙන් අපූරු පාඩමක්



සවෙත්මි ගුණසේකර

# හා පැංචාගෙන් අපූරු පාඩමක්

සවෙත්මි ගුණසේකර

ප්‍රථම මුද්‍රණය : 2023

කර්තෘ : සවෙත්මි ගුණසේකර

ලිපිනය : 44/7, ශ්‍රී බෝධිරාජ මාවත,
බූවැලිකඩ,
මහනුවර.

ISBN අංකය : **ISBN 978-624-206-732-2**

මුද්‍රණය
**"PRESS"**
නො: 24, කොටුගොඩැල්ල වීදිය,
මහනුවර.

# පිදුම

***නිති දැනුමෙන් පෝෂණය කරන්නට වෙර දරන,***

***මාගේ සදාදරණීය විදුහල්පතිතුමිය,***

***පන්තිභාර ගුරුතුමිය,***

***ඇතුළු ගුරු මව්පියවරුන්ටත්,***

***මා පෝෂණය කරන, ඇතිදැඩි කරන***

***මාගේ මව්නි, පියාණෙනි ඔබ දෙපලටත්,***

***මා වැනිම දැනුම හඹා යන***

***මාගේ සොයුරු කැළටත්***

***මේ පොත ආදරයෙන් පුද කරමි.***

✳ ✳ ✳

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් දිවිය දිනන ''විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ ''දිවිය දිනන විද්‍යුත් පොතක්''ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.


මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක් වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරු භවතුන්, දෙමාපියන් ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල්වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023-01-01

එක්තරා ලස්සන කැලෑවක හා පවුලක් ජීවත් වුණා. දවසක් උදෑසනම හා අම්මා නැගිටලා වත්ත පහළ එළවළු කොටුවට ගියා.



අනේ හා අම්මලාගේ එළවළු කොටුවට රෑ හොරු පැනලා. කැරට් අල කාලා. ගෝවා පාත්තිය විතරක් ඉතුරු කරලා ගිහින්. හා අම්මාට හරිම දුකයි.



අනේ පුතේ කැරට් අල නැහැ. රෑ කවුරුහරි ඇවිත් කැරට් අල ඔක්කොම කාලා ගිහිල්ලා. හා අම්මා හරිම දුකෙන් කිව්වා. හා පැංචා පාසල් යන්න ලෑස්ති වුණා.


අම්මාටයි තාත්තටයි වැඳලා හා පැංචා පාසැල් ගියා.



වලස් පැටියා, අලි පැටියා, ඉත්තෑ පැටියා, රිලා පැටියා එකවරම ළඟට ඇවිත්, මොකද යාළුවේ අද දුකෙන් කියලා ඇහුවා.

හා පැංචා වුණ හැම දෙයක්ම යාළුවන්ට කිව්වා.

යාළුවෝ ගොඩක් දුක් වුණා.



පාසල ඇරුණ ගමන් හා පැංචා කැලය මැදින් වේගයෙන් දුවලා ගෙදරට ගියා.



හා අම්මයි හා තාත්තයි හා පැංචයි රෑ වෙනකල්ම බලාගෙන හිටියා, කවුද මේ එළවළු කොටුවට හොරෙන් එන්නේ කියලා බලන්න.



හොඳටම රෑ වුණා. කට්ටියම ඉලුක් පඳුර ළඟ හැංගිලා හිටියා කවුද මේ හොරා කියලා බලන්න.

එක පාරටම උෟරු රාළ වටපිට බලලා එළවළු කොටුවට රිංගලා ඉතුරු වුණු ගෝවා ගෙඩි කන්න පටන් ගත්තා.

''ආ... මෙන්න අපේ කැරට් හොරා අහු වුණා! අහු වුණා! හොරකම් කරන එක නරක පුරුද්දක්.'' හා පැංචා කිව්වා.


උෟරු රාළට ලැජ්ජා හිතුණා. සමාව අරගෙන එතනින් යන්න ගියා.

‘‘උඟුරු රාළ හරිම පව් අම්මේ. උඟුරු රාළගේ පැටව් බඩගින්නේ වෙන්න ඇති.’’ හා පැංචා කිව්වා.

‘‘හොරකම් කරන එක නරක පුරුද්දක් පුතේ.’’ හා අම්මා හා පැංචාගේ ඔළුව අතගාන ගමන් කිව්වා.



පසුව දා උදෙන්ම උෟරු රාළගේ ගෙදර හා පැංචා ගියා ගෝවා ගෙඩි අරගෙන උෟරු රාළට දෙන්න.



උෟරු රාළ පැටව් එක්ක හොඳටම බඩගින්නේ ඉන්නේ. හා පැංචා උෟරු රාළට කතා කළා. හා පැංචා ගෙනාපු ගෝවා ගෙඩි උෟරු රාළට දුන්නා. නැති බැරි වෙලාවට හැමෝටම උදව් කරන්න කියලා හා පැංචා ගියා.

හොරකම් කරන එක නරක පුරුද්දක් කියලා උෟරු රාළ තේරුම් ගත්තා. හා පැංචාගෙන් අපූරු පාඩමක් උෟරු රාළ ඉගෙන ගත්තා.





# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොතපතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිව යුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කුරු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023-11-01